# ආඩම්බර සඳුනි



වෙඩීරා ටෂානී සෙනෙවිරත්න

# ආඩම්බර සඳුනි

වෙයීරා ටෂානී සෙනෙවිරත්න

කතා

මහමායා බාලිකා විද්‍යාලය මහනුවර
6D

2025-02-04

ISBN 978-624-208-465-7

# ..පිදුම..

නිර්මාණකරනයට මාව දිරිගැන්වූ මගේ මුල්ම පාසල් ගුරුතුමිය වන ප්‍රියන්ති ඉන්ද්‍රසිංහ ගුරුතුමියට,

පොත් කියවීමට මාව යොමුකල මාගේ දෙමව්පියන්ට, කුඩා කල මා හට කතන්දර කියූ අත්තම්මාට,

ප්‍රවීණ මාධ්‍යවේදී, ලේඛක නිමල් ඇස්. බෝගහවත්ත වන මාගේ ලොකු අත්තාට

සහ

මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු සියළු ගුරු මණ්ඩලයට

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි.පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියත් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන හෙරණගත්කරණි ව්‍යාපෘතිය හඳුනා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරන්නට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැල්ලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශෂිකලා සේනාධීර,

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එකමත් එක රටක හිටියා ලස්සන පුංචි ළමයෙක්. එයාගෙ නම සඳුනි. එයා හරිම ලස්සනයි. එයා ලස්සන වුණාට එයා හරි ආඩම්බරයි වගේම හරි නපුරුයි. ඒ නිසාම එයාට කවුරුත් යාළුවෝ හිටියෙ නෑ. කවුරුත් එයාට කැමති නෑ.



ඔන්න ටික කාලයක් ගියාට පස්සෙ සඳුනි පළවෙනි වතාවට ඉස්කෝලෙ ගියා. එදා එයා කවුරුත් එක්ක කතාකරන්නෙවත් නැතුව පුම්බගෙන හිටියා. එයත් එක්ක තව යාළුවො යාළු වෙන්න හැදුවා. ඒත් සඳුනි ඒ යාළුවෝ හැමෝමව තල්ලු කරල දැම්මා.

ඔහොම ටික දවසක් ගියා. සඳුනිගෙ අම්මාට තව චූටි බබෙක් හම්බෙන්නයි යන්නෙ.

ඒ එක්කම සඳුනි තව ටිකෙන් ටික නරක් වෙනවා. එයාට වාර විභාගෙට ලකුණු හොඳටම අඩුයි. එයා ටීචගෙන් හොඳටම බැනුම් ඇහුවා.



දෙමාපිය රැස්වීමෙදී එයාගෙ දෙමව්පියොත් හොඳටම බැනුම් ඇහුවා. ඒ ටීචගෙන් විතරක් නෙමේ, ප්‍රින්සිපල්ගෙනුත් හොඳටම බැනුම් ඇහුවා. මේ ළමයා ඊළඟ විභාගයට හොඳට ලකුණු ගත්තෙ නැත්තම් ඉස්කෝලෙන් අස් කරනවා කියලා.

මේකට සඳුනිගෙ අම්මාටයි තාත්තාටයි හොඳටම දුක හිතුනා. ගෙදර ගිහිල්ලාත් සඳුනි හොඳටම බැනුම් ඇහුවා.

ඔන්න ටික දවසකින් සඳුනි ට නංගියෙක් හම්බුනා. එයාගෙ නම සමනලී. එයා නම් සඳුනි තරම් ලස්සන නෑ. ඒ නිසා සඳුනි නංගිට පොඩ්ඩක් වත් ආදරේ නෑ.



ඔන්න ඊලඟ වාර විභාගෙ ආවා. සඳුනි ඒකට නම් සාමාන්‍ය ලකුණු ගත්තා. "අපෝ ඇතියන්තං. නූලෙන් ගැලවුනේ" සඳුනි තනියම හිතුවා. එයාට ඉතිං කතාකරන්න කියලාවත් යාළුවෙක් නැනෙ. ඉන්න එකම එක්කෙනත් නංගි විතරයි. සඳුනි එයාටත් කැමති නැනෙ.

ඔන්න ඔහොම ටිකෙන් ටික තත්පර, විනාඩි, පැය, දවස්, සති, මාස, අවුරුදු ගෙවිලා ගියා.

සමනලී ටිකෙන් ටික ලොකු වුණා. ගමේ හැමෝම සමනලී එක්ක යාළුයි. සමනලීට හරි සතුටුයි.

ඒ වුණාට සඳුනි නම් තාම එක යාළුවෙක්වත් නෑ.



සඳුනිට සමනලී ගැන ගොඩක් ඊර්ශ්‍යා හිතුණා. සඳුනි ගොඩක් වෙලාවට තනියම ඉඳගෙන කල්පනා කර කර ඉන්නවා.

" හරි, නංගිට ඉන්නෙ ගමේ යාළුවො විතරනෙ. තව ටික දවසකින් එයා ඉස්කෝලෙ ගියාම ඔය ඉන්න යාළුවොත් නැතිවෙයි." ඔය වගේ නපුරු දේවල් තමා එයා හිතන්නෙ.

එයා පොඩි වැරැද්දටත් අම්මගෙන් ගුටි කනවා. තාත්තත් ගහනවා. ටීචත් ගහනවා. එයාට දුක කියන්න කවුරුත් නෑ.

වෙලාවකට එයාට හිතෙනවා එයා යාළුවොන්ට නපුරු වුනේ නැත්තම් දැන් එයාට ගොඩක් යාළුවො ඉන්නවා කියලා. ඒත් එහෙම හිතුවා කියලා කවදාවත් එයා හොඳ ළමයෙක් වෙන්නෑ.

ඔන්න දැං සඳුනි ඉන්නෙ පහ ශ්‍රේණියේ. ශිෂ්‍යත්වෙටත් ඔන්න මෙන්න. එයා ශිෂ්‍යත්වෙ හරිම තරහෙන් ලිව්වා.



ප්‍රතිඵල ආවා. සඳුනිට දෙසීයෙන් පනහයි.

ටික කාලෙකට පස්සෙ එයාගෙ නංගිත් පළවෙනි සැරේට ඉස්කෝල් ගියා.

සමනලී ඉස්කෝලෙ ගියාට පස්සෙ තව යාළුවො ගොඩක් හම්බුණා.



අනේ එයා හැම විභගයෙන්ම හොඳට ලකුණු ගත්තා.



අම්මටයි තාත්තටයි හරිම කීකරුයි. හොඳට පාඩම් වැඩ කරනවා.එයා යාළුවොත් එක්ක සෙල්ලමුත් කරනවා.

එයා ශිෂ්‍යත්වයත් ඉහළින්ම සමත් වුණා. ඉහළින් සමත් වුණා කියලා එයා කවදාවත් ආඩම්බර වුන්නෑ.




ඒ අතරේ දැං සඳුනි සාමන්‍ය පෙළ විභාගයට මුහුණ දුන්නා.

ප්‍රතිඵල ආවා. සඳුනි ට අඩු ගානෙ එස් එකක්වත් නෑ.




ඊළඟ අවුරුද්දෙත් එයා ලිව්වා. ඒකෙත් එයා පාස් නෑ. තුන්වෙනි පාර නම් යන්තම් පාස්.

ඔන්න සඳුනි උසස්පෙළත් ලිව්වා. ඒ ලිව්වෙ සඳුනිට වයස අවුරුදු 20 දී. ඒකෙන් එයා පාස් වුණේ නෑ.




එයා ආයෙ ලියන්න හිතුවෙත් නෑ.

ඒ අතරෙ සමනලී සාමාන්‍ය පෙළ ලිව්වා. එයාට A9 ම තියෙනවා.

" අනේ නංගි කොච්චර හොඳද? මං මේ විදිහ වුණේ ඇයි? කමක් නෑ. මං වෙනුවෙන් නංගි සමත් වුණානෙ." ඔන්න දැන් සඳුනි ටිකටික හොඳ වෙන්න පටන් ගත්තා.

ඒත් එතකොට පරක්කු වැඩියි. ඒ වුණාට එයා ස්වාදීනව ඉගෙන ගන්න පටන් ගත්තා.

දැං සමනලී උසස් පෙළ ලිව්වා. එයාට A3 යි.

දැං දෙන්නම ගෙදර. දෙන්නා දැං ව්‍යාපාරයක් පටන් ගත්තා.

පොඩි පොඩි පැළ හිටවලා විකුණනවා.

වූල් වලින් එකඑක ඒවා ගොතලා විකුණනවා.

ඔන්න සමනලී කැම්පස් තේරුණා.

එයා කැම්පස් ගියාට දැං සඳුනි තනියම ව්‍යාපාරය කරගෙන ගියා.

සමනලී විශ්ව විද්‍යාල අධ්‍යාපනය අවසන් කලා. එයා ඊට පස්සෙ විශ්ව විද්‍යාල කථිකාචාර්යවරියක් වුණා.

……නිමි……

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් නොපැවීම සහ එළි දැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව එදා 2014 වසරේ පටන් මාගේ සංකල්පයට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමකි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියනියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අන්ථර්කාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වේ. මෙයට පිලියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට නි පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශින්සන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්දීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-465-7